සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - I

නම/විභාග අංකය :- ...............................................................................　　කාලය : පැය 01 යි.

---

- ❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ''මග, සරිස, ධ, නිස,'' යන ස්වර සංගතිය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ
    (1) ගනි කෝමල කළවිට (ග නි) කාෆි රාගයේ මුඛ්‍යාංගය වේ.
    (2) ම තීව්‍ර කළ විට (ම්) යමන් රාගයේ මුඛ්‍යාංගය වේ.
    (3) රි ග ධ නි කෝමළ කළ විට (රි ග ධ නි) භෛරවී රාගයේ මුඛ්‍යාංගය වේ.
    (4) ම නි ඉවත් කළ විට භූපාලි රාගයේ මුඛ්‍යාංගය වේ.

02. රාත්‍රී ප්‍රථම ප්‍රහරයෙහි ගැයීමට සුදුසු රාගයකි.
    (1) බිලාවල්　(2) යමන්　(3) කාෆි　(4) භෛරවී

03. ''රි ග ම ධ නි'' යන ස්වර අනුවාදී ස්වර වනුයේ කිනම් රාගයේ ද?
    (1) කාෆි　(2) භෛරවී　(3) භූපාලි　(4) යමන්

04. භූපාලි රාගයට අයත් ස්වර ඛණ්ඩය තෝරන්න.
    (1) නි රි ග ම් ග රි ස　(2) රි ග රි ම ග රි ස　(3) ම ග ම රි ස රි ස　(4) ස රි ග ප ග රි ස

05. දිවා ප්‍රථම ප්‍රහරය තුළ ගැයෙන නිර්දේශිත රාග යුගලය වනුයේ.
    (1) භෛරවී - යමන්　(2) බිලාවල් - භෛරවී　(3) යමන් - බිලාවල්　(4) කාෆි - භූපාලි

06. පහතරට වන්නම් හා සබරගමු වන්නම් සඳහා යොදා ගනු ලබන අවනද්ධ භාණ්ඩ යුගලය පිළිවෙළින් තෝරන්න.
    (1) ගැටබෙරය - යක්බෙරය　(2) දවුල - ගැටබෙරය
    (3) යක්බෙරය - දවුල　(4) යක්බෙරය - ගැටබෙරය

07. පහතරට සිංදු වන්නම් සංඛ්‍යාව කොපමණ ද?
    (1) 16　(2) 18　(3) 24　(4) 32

08. නූතන ලෝකයේ "symphony orchestra" සඳහා ප්‍රචලිත සංගීතඥයෙකි.
    (1) යානි　(2) මෝසාර්ට්　(3) බීතෝවන්　(4) රවිශංකර්

09. කිසියම් තාලයක තාල පදය හඳුන්වනුයේ,
    (1) විභාග යනුවෙනි　(2) තාල සංඥා යනුවෙනි　(3) මාත්‍රා යනුවෙනි　(4) ඨේකාව යනුවෙනි

10. කාෆි රාගයට අයත් තානාලංකාරය කුමක් ද?
    (1) ස - රිග පධ ස̇-/ස̇- ධප ගරි ස-/　(2) සස රිරි ගග මම/ප- පම ගරි ස-/
    (3) නිරි ගම පධ පම ගම පම ගරි ස-　(4) ගම ධනි ස̇රි ස̇-/නිධ පම ගරි ස-/

පහත සඳහන් වගුව ආශ්‍රයෙන් 11 - 13 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A - ගී පාද කොටස | B - නාට්‍යයේ නම |
|---|---|
| (1) සෝබාවදේ මෙපුර | (1) අබුද්දස්ස කෝලම |
| (2) පළමුව මම වැන්ද බුදුන් | (2) තාරාවෝ ඉගිලෙති |
| (3) අපෙ මුනිසඳ ඉර්දි බලෙන් | (3) කුස පබාවතී |
| (4) රතඳර සිරියා පරදන | (4) මධුර ජවනිකා |

11. වගුවේ A - 1 කොටසට අදාල නිවැරදි පිළිතුර වනුයේ
(1) B - 1 (2) B - 3 (3) B - 2 (4) B - 4

12. කුස පබාවතී නාට්‍යයට අදාල ගී පාදය දැක්වෙනුයේ
(1) A - 4 (2) A - 1 (3) A - 3 (4) A - 2

13. රෝස නෝනා සහ ජැංඩි සිංකෙදෝ යන චරිත ඇතුළත් නාට්‍යය පිළිබඳව සඳහන් වනුයේ
(1) B - 1 (2) B - 4 (3) B - 3 (4) B - 2

14. දවුල් පදය හා ඉරට්ටිය යන කොටස් යෙදෙන වන්නම් යුගලයට අදාල නිවැරදි පිළිතුර කුමක් ද?
(1) සබරගමු වන්නම් - පහතරට වන්නම් (2) සබරගමු වන්නම් - උඩරට වන්නම්
(3) උඩරට වන්නම් - සබරගමු වන්නම් (4) පහතරට වන්නම් - උඩරට වන්නම්

15. ×ධ ගෙ න ති | 0න ක ධි න | යනුවෙන් භාවිතා වන මාත්‍රා අටකින් යුත් තාලය මෙනම්න් හැඳින්වේ.
(1) දීප්චන්දි (2) දාදරා (3) කෙහෙර්වා (4) ත්‍රිතාල්

16. මේ අවුරුදු කාලේ - හිනහ වෙයන් රාලේ නම් ගීතය ගයන ගායකයා කවුරුන් ද?
(1) රෝහණ බැද්දගේ මහතා (2) සී. ද. එස්. කුලතිලක මහතා
(3) ඩබ්. බී. මකුලොලුව මහතා (4) ලයනල් රංවල මහතා

17. ප්‍රවීන ගසල් ගායකයකු හා ප්‍රවීන බටනලා වාදකයකුගේ නම් පිළිවෙළින් තෝරන්න.
(1) රවිශංකර් - ජග් ජිත් සිං (2) ජග් ජිත් සිං - හරිප්‍රසාද් චෞරසියා
(3) අල්ලාරක්බාරහමන් - ජග්ජිත් සිං (4) රවි ශංකර් - හරි ප්‍රසාද් චෞරසියා

18. උච්ච සඩ්ජයේ (ස̇) සංඛ්‍යාතය කොපමණ ද?
(1) 512 (2) 256 (3) 288 (4) 128

19. ලක්ෂණ ගීත සඳහා නොගැළපෙන පිළිතුර කුමක් ද?
(1) රාග ලක්ෂණ ඇතුළත් කර තිබීම (2) ස්ථායි - අන්තරා ආකෘතිය තිබීම
(3) ස්වර පමණක් යොදා ගැනීම (4) රාග සංගති හා තාල යොදා ගැනීම

20. දොහොරාවක් සහිත නුර්ති ගීයක මුල් පාදය වේ
(1) සුවඳ පද්ම මීළු ආදි නොයෙක පුෂ්පයෙන් සැදි (2) අප ගුණ සරු සිංහල භූපති
(3) දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා (4) වාසනා දිනේකි මේක පාමු තුටින්

පහත සඳහන් වගුව ආශ්‍රයෙන් 21 - 24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ගී පාද | තාල නාම |
|---|---|
| (1) සඳ කිරණ නැති දාට ඝන අන්ධකාරේ | (a) දීප්වන්දි |
| (2) මිහිකත නළවාලා | (b) ජප් තාල් |
| (3) සසර සරනැස නිවා සනහන | (c) කෙහෙර්වා |

21. ඉහත වගුවේ 1, 2, 3 යන ගී පාදයන්ට ගැළපෙන තාල නාමයන්ට අදාල අක්ෂර පිළිවෙළින් තෝරන්න.
(1) a b c (2) b c a (3) c b a (4) a c b

22. ' C ' අක්ෂරයට අදාල තාලයට ගැළපෙන අපරදිග තාල සංකේතය වනුයේ
(1) $\frac{3}{4}$ (2) $\frac{5}{8}$ (3) $\frac{4}{4}$ (4) $\frac{6}{8}$

23. ' a ' අක්ෂරයෙන් දක්වා ඇති තාලයේ මාත්‍රා සංඛ්‍යාව හා විභාග බෙදෙන පිළිවෙළ වනුයේ
(1) මාත්‍රා 14 - විභාග 3/4 බැගිනි
(2) මාත්‍රා 10 - 2/3 බැගිනි
(3) මාත්‍රා 16 - විභාග 4/4 බැගිනි
(4) මාත්‍රා 08 - විභාග 4/4 බැගිනි

24. a හා b තාලයන්ට ගැළපෙන දේශීය තිත් නාම වනුයේ
(1) මහ තනි තිත - සුළු මැදුම් දෙතිත
(2) මැදුම් මහ දෙතිත - මැදුම් තනි තිත
(3) මහ තනි තිත - මැදුම් මහ දෙතිත
(4) මැදුම් මහ දෙතිත - සුළු මැදුම් දෙතිත

25. ග - ම/ප - ග/ම - ග/රි - - / යන ස්වර පාදය මධ්‍යම භාවයෙන් ලියූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) ධ - <u>නි</u>/ ස̇ - රි̇/ස̇ - <u>නි</u>/ධ - - /
(2) ධ - නි/ස̇ - ධ/ධ - නි/ස̇ - - /
(3) ධ - <u>නි</u>/ ස̇ - ධ/ <u>නි</u> - ධ/ප - - /
(4) ධ - නි/ස̇ - නි/ධ - නි/ප - - /

පහත ස්වර පුවරුව ඇසුරින් 26 - 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




26. C major chord එක සඳහා ගැළපෙන අංක තෝරන්න.
(1) 1 + 4 + 8 (2) 1 + 6 + 8 (3) 1 + 3 + 5 (4) 1 + 5 + 8

27. D minor chord එකට ගැළපෙන ස්වරවලට අදාළ අංක වනුයේ
(1) 3 + 5 + 10 (2) 3 + 6 + 10 (3) 3 + 5 + 8 (4) 3 + 6 + 8

28. ඉහත ස්වර පුවරුවේ 2, 4, 9 හා 11 යන අංක යොදා ඇති ස්ථාන වලට අයත් ස්වර මොනවාද?
(1) <u>රි</u> <u>ග</u> <u>ධ</u> <u>නි</u> (2) රි ග ධ නි̇ (3) රි ග <u>ධ</u> <u>නි</u> (4) රි <u>ග</u> ධ <u>නි</u>

29. ගැමි ගී හා සේ ගී සඳහා නිදසුන් වේ.
(1) ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ - එක පඳුරින් ලී සයක් කපාගෙන
(2) රැගත් සුරා පිරූ විතින් - පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට
(3) මේ කාගේ දෝ කමතා - ඉපිද එබෝසත් නාලොව වාරෙක
(4) තුරු රත්න සිරි ලෙසිනා - මෝරා බීජයෙනා

30. අනාඝාතාත්මක ගැමි ගීයක් නොවේ.

(1) ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
(2) පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
(3) වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනී
(4) තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා

31.  යන අපරදිග සංකේතයන්හි වටිනාකම් පිළිවෙළින් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) මාත්‍රා 1 - 2 - 4 - $\frac{1}{2}$
(2) මාත්‍රා 2 - 4 - 1 - $\frac{1}{2}$
(3) මාත්‍රා 4 - 2 - $\frac{1}{2}$ - 1
(4) මාත්‍රා $\frac{1}{2}$ - 2 - 4 - 1

32. ''ඉගෙනීම උදෙසාය ලොව දිනුවේ'' යන ගී පාදයට අයත් මාත්‍රා සංඛ්‍යාව කොපමණ ද?

(1) 16 (2) 10 (3) 12 (4) 18

33. යතුරු පුවරු සංගීත භාණ්ඩ මගින් කරනු ලබන නිර්මාණ මෙනමින් හැඳින්වේ.

(1) E - Learning (2) E - MUSIC (3) MIDI File (4) Wikipedia

34. ''නි රි ස, නි රි ග රි ස, නි රි ග ම් ග රි ස'' යන ස්වර අභ්‍යාස කොටස කිනම් රාගයකට අයත් වේ ද?

(1) භූපාලි (2) බිලාවල් (3) යමන් (4) කාෆි

35. ගුත්තිල කාව්‍යයේ සැණකෙළි වැනුමේ එන ''සඳවා සුදු වැලි පිවිතුරු'' යන ගී පාදය අයත් වනුයේ

(1) දොළොස්මත් පැදි ගණයටය.
(2) සොළොස්මත්පැදි ගණයටය.
(3) ද සමත් පැදි ගණයටය
(4) අටවිසිමත් පැදි ගණයටය.

36. ගුවන් විදුලි සරල ගීයට මුල් අත්තිවාරම් සැකසූ ගායකයින් දෙදෙනෙකි.

(1) ආර්. ඒ. චන්ද්‍රසේන සූරීන් හා ඩබ්. ඩී. අමරදේව ශූරීන්
(2) සුනිල් ශාන්තශූරීන් හා ඩබ්. ඩී. අමරදේව ශූරීන්
(3) ආනන්ද සමරකෝන් ශූරීන් හා ආර්. ඒ. චන්ද්‍රසේන ශූරීන්
(4) ආනන්ද සමරකෝන් ශූරීන් හා සුනිල් ශාන්ත ශූරීන්

37. තබ්ලාවේ දායාව හා බායාවේ අක්ෂර එකතුවෙන් උපදින අක්ෂර යුගලයකි.

(1) ති - කත් (2) තිං - ධිං (3) ධා - ධිං (4) තා - ධිං

38. ස්පාඤ්ඤ භාෂාව හා වේග රිද්මයෙන් යුක්ත ගී විශේෂයකි.

(1) කපිරිඤ්ඤා ගීත (2) වංග ගීත (3) කණ්ඩායම් ගී (4) කැලිප්සෝ ගී

39. ස, ග, ප යන ස්වර යන්හි 3rd Harmony ස්වර වනුයේ

(1) ග ම ප (2) ග ප ධ (3) ග ධ නි (4) ග ප නි

40. නාඩගම් ගීත සඳහා සංගීතය සපයන ලද සංගීතඥයෙකි.

(1) ගණිතාලංකාර (2) අලගනායිදු (3) අමීර්බුෂ්රු (4) අබ්දුල් සතාර්

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - II

**නම/විභාග අංකය :-** ................................................................................ **කාලය : පැය 02යි.**

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.

(i) නිර්දේශිත රාග අතරින් සම්පූර්ණ ජාතියට අයත් රාග ගණන කොපමණද?

(ii) කල්‍යාණ මේලයෙන් උපදින රාග යුගල නම් කරන්න.

(iii) සස, රි රි, ගග, මම, ප යන මුඛ්‍යාංගය කාෆි රාගයට අනුව නිවැරදි කරන්න.

පහත සඳහන් ගීපාද අයත් ගී වර්ගය නිවැරදි කර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

| ගී පාදය | ගී වර්ගය |
|---|---|
| (iv) සාදු දන්ත දා වඩිමි සාර ශාන්ති ශ්‍රී පතාලා | භෛරවී රාගය ආශ්‍රිත සරල ගීතයකි |
| (v) කඳුළු හෙළා නෑඹිලියට සහල් ගරන අම්මා | යමන් රාගය ආශ්‍රිත සරල ගීතයකි |
| (vi) එන්න මදනලේ ගොස් පවසන්න දුක මගේ | ජන ගී ආශ්‍රිත සරල ගීතයකි (කුවේනි අස්න) |

පහත හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ප්‍රශ්න අංකය සමග ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.
(ආඝාතාත්මක, 2/3, මැදුම් මහ දෙතිත, අනාඝාතාත්මක, 3/4, සුළු මැදුම් දෙතිත)

(vii) පැල් රැකීමේ දී ගයන ලද ගී බොහෝවිට .............................................. ගී වර්ගයට අයත් වේ.

(viii) ගොයම් ගී හා කෙළි ගී අයත් වන්නේ .............................................................. ගී වර්ගයටය.

(ix) ''රෑ රුසේ ඇදිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා'' යන ගී පාදය ............................................... අනුව ගැයේ.

(x) ඛ්ඩප් තාලයට සමාන දේශීය තිත ......................................... වන අතර එය විභාග වනුයේ මාත්‍රා ......................... බැගිනි.

02. (i) පහත සඳහන් රාග විස්තර වගුව සම්පූර්ණ කරන්න.

| ගී පාදය | මේලය | ආරෝහණ | ජාතිය | වාදී | සංවාදී | ගායන සමය |
|---|---|---|---|---|---|---|
| (a) ........... | ................ | ස රි ග ම් ප ධ නි ස̇ | .......... | ග | ............ | රාත්‍රී ප්‍රථම ප්‍රහරය |
| (b) බිලාවල් | ................ | .......................................... | සම්පූර්ණ | ....... | ග | ......................... |
| (c) ........... | ................ | ස රි ග̲ ම ප ධ නි̲ ස̇ | .......... | ප | ............ | රාත්‍රී දෙවන ප්‍රහරය |

(ii) ඉහත b, c රාග අතරින් එක් රාගයක මධ්‍යලය ඛ්‍යාල ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) a රාගයට ගැළපෙන මාත්‍රා 8කට නො අඩු තානාලංකාරයක් ලියන්න.

03. (i) මාත්‍රා 4 බැගින් යෙදෙන නිර්දේශිත හින්දුස්ථානි තාල නම් කරන්න.

(ii) මින් මාත්‍රා 16කින් යුත් තාලය නම්කර එය නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න.

(iii) පහත සඳහන් A B C ගී පාදයන්හි මාත්‍රා බෙදීමට ගැළපෙන හින්දුස්ථානි තාල නම් කරන්න.

A - රන්මලක් ලෙස දෙව් බඹුන්

B - මොර හිඹුටු දම් පනා

C - වෙසක් කැකුළු අතු අග හිඳ

(iv) B ගී පාදයට ගැළපෙන දේශීය තිත නම් කර එය නිවැරදි තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

04. දේශීය රංග සම්ප්‍රදායන් තුනකට අයත් තොරතුරු ඇතුළත් වගුවක් පහත දැක්වේ.

| A | B | C |
|---|---|---|
| (1) කෝලම් | වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ | මද්දලය, හොරණෑව |
| (2) නාඩගම් | පෙරසිට පැවත එන - සිරිතට පොදිය බැඳගෙන | තබ්ලාව, හාර්මෝනියම් |
| (3) නූර්ති | ගම්හිර තෙදැති කොන්ස්තන්තීනු පුරේ | පහතරට බෙරය, තාලම්පට |

(i) ඉහත වගුවෙහි ඇතුළත් තොරතුරු 1, 2, 3 අංක යටතේ නිවැරදි කර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) අංක 2 හා 3 රංග සම්ප්‍රදායන්හි සංගීතමය ලක්ෂණ 4ක් සංසන්දනය කරන්න.

(iii) අංක 1 රංග සම්ප්‍රදාය පිළිබඳ සුවිශේෂතා 4ක් ලියන්න.

05. (i) ව්‍යවහාරික සංගීතයට අයත් පහත වගුවේ ඇති a b c d ගී පාද වලට ගැළපෙන ගී වර්ගය වරහන් තුළින් තෝරා ලියන්න.

(ග්‍රැමෆෝන් ගී, මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී, කපිරිඤ්ඤා ගී, නවනාට්‍ය ගී)

| ගී පාදය | ගායන ශිල්පියා/ශිල්පිනිය |
|---|---|
| (a) රස ආහර කවලා | 1. ආනන්ද සමරකෝන් සූරීන් |
| (b) බැස සීතල ගඟුලේ | 2. ශිල්පී ජැක්සන් ඇන්තනි, ශිල්පිනිය අනුලා බුලත්සිංහල |
| (c) පළමුව මම වැන්ද බුදුන් | 3. එච්. ඩබ්ලිව් රූපසිංහ මාස්ටර් - ශිල්පිනී කෝකිල දේවි වීරතුංග |
| (d) මව්පියො ආදී සොඳුරු තමාගේ | 4. ශිල්පී එම්. එස්. ප්‍රනාන්දු |

(ii) වගුවේ ඇතුළත් ගීත ගයන ගායන ශිල්පියා/ශිල්පිනිය තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය යටතේ ලියන්න.

(iii) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන එහි සංගීතමය ලක්ෂණ 4ක් ලියන්න.

- ග්‍රැමෆෝන් ගී
- කපිරිඤ්ඤා ගී
- මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී

06. (i) පහත සඳහන් මාතෘකා යටතේ කරුණු 4ක් සංසන්දනාත්මකව ලියන්න.

- සබරගමු වන්නම් - පහතරට වන්නම්
- ගැමි ගී - සේ ගී

(ii) ආඝාතාත්මක පැදි හා අනාඝාතාත්මක පැදි අතර සුවිශේෂතා නිදසුන් මගින් පැහැදිලි කරන්න.

07. අපරදිග සංගීතයට අයත් ප්‍රස්තාර කොටසක් පහත දැක්වේ.



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට අනුව ප්‍රස්තාර කරන්න.

(ii) එම ප්‍රස්තාරය මත එක් එක් විභාගයට ගැළපෙන කෝඩ්ස් (chords) සඳහන් කරන්න.

(iii) පහත සඳහන් අපරදිග සංගීතඥයින්ගෙන් එක් අයෙකුගෙන් අපරදිග සංගීතයට ඉටු වූ සේවය කරුණු 4ක් යටතේ විස්තර කරන්න.

- මෝසාර්ට්
- බීතෝවන්
- යානි